# HARTI

# ආහාර තොරතුරු විවරණිකාව


13 වෙළුම 2020 පෙබරවාරි නො.:02


## සහල්

සියළුම වර්ගයේ සහල් සඳහා වූ තොග මිල පසුගිය මාසයට සාපේක්ෂව පහළ ගොස් ඇති අතර උපරිම මිල පහළ යාම වූ කිලෝවකට රු.13.89ක් රතු කැකුළු සඳහා සටහන් විය. රජය විසින් 2019.12.19 වන දින පනවන ලද උපරිම සිල්ලර මිල වූ කිලෝවකට රු.98.00 මට්ටමේ සම්බා සහ නාඩු සහල් සිල්ලර මිල තවදුරටත් නොවෙනස්ව පැවතුණි.

## එළවළු

මහ (2019/20) කන්නයේ අස්වනු නෙළීම ආරම්භ විය. එම නිසා බොහොමයක් වෙළෙඳපොළවලට එළවළු තොග සැපයුම ඉහළ ගොස් තිබුණි. සියළුම උඩරට එළවළු වර්ග සඳහා සිල්ලර මිල 5%-30% ද පහතරට එළවළු සිල්ලර මිල 6%-28% ද පරාසයන් තුළ පහළ යන ලදී. ඉදිරි මාසයේ දී ද එළවළු මිල ගණන් පහළ යාමක් අපේක්ෂා කළ හැකිය.




අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය ,
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
114, විජේරාම මාවත , කොළඹ 07.
කෘෂිකර්ම අමාත්‍යාංශය
දු.අ. 011-2696981 ෆැක්ස් 011-2682283
විද්‍යුත් තැපැල mfpaharti@yahoo.com. අන්තර් ජාලය www.harti.gov.lk

**සටහන**

මෙම විවරණිකාව මාසිකව ප්‍රකාශයට පත් කරනු ලබන අතර ඒ මඟින් තෝරා ගන්නා ලද ප්‍රධාන ආහාර ද්‍රව්‍යයන්ගේ ගොවිපල මිල, තොග මිල සහ සිල්ලර මිල පිළිබඳව සලකා බැලේ. මෙහිදී ඉදිරිපත් කරන තොරතුරු කොළඹ සහ තදාසන්න නාගරික කේන්ද්‍ර කීපයක සහ තෝරා ගන්නා ලද ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශවල වෙළෙඳපොළ ආශ්‍රයෙන් සිදු කෙරේ. වගා බිම් ප්‍රමාණය, නිෂ්පාදන ප්‍රමාණය සහ ආනයන ප්‍රමාණය යන තොරතුරු මෙම විවරණිකාවේ අන්තර්ගත වේ.

පවතින මිල ගණන්, මිල පරාසයන් සාමාන්‍ය, පසුගිය මාසයේ සහ පසුගිය වර්ෂයේ එම මිල ගණන් සමඟ සංසන්දනාත්මකව විග්‍රහ කෙරේ. මෙහි තිබෙන මිල ගණන් විශේෂයෙන් සඳහන් නොකර තිබේ නම් එය පසුගිය මාසයේ මිල ගණන් හා සංසන්දනය කර ඇති බව සැලකේ.

**සම්බන්ධීකරණය**
ආචාර්ය ඊ.ඒ.සී.ප්‍රියංකර

**පර්යේෂණ කණ්ඩායම**

| | |
|---|---|
| ඩබ්.ඒ.එන්.විජේසූරිය | - වී |
| ආචාර්ය එන්.පී.ජී.සමන්ත | - සහල් |
| රෝෂිණී රඹුක්වැල්ල | - වියළි මිරිස්, ලූනු |
| ආචාර්ය ඊ.ඒ.සී.ප්‍රියංකර | - එළවළු |
| රුවිනි විදානපතිරණ | - අර්තාපල් |
| ඉන්දිකා එදිරිසිංහ | - පලතුරු |
| ආචාර්ය ඊ.ඒ.සී.ප්‍රියංකර | - කරවල, මස්, මාළු, බිත්තර |
| අයි.වී.කුරුප්පු | - තිරිඟු පිටි , සීනි |
| අයි.පී.පී.එම්.විජේසිංහ | - මාෂ භෝග |

**දත්ත සහ තොරතුරු සම්පාදනය**
පී.ජී.ඒ.රත්නසිරි
ඩබ්.ජී.එන්.මල්කාන්ති

**දත්ත සැකසුම**
කේ.ඒ.ආර්.පත්මසිරි

**පරිගණක ගත කිරීම**
ඩී.ජේ. ගමගේ

දත්ත රැස් කරන ප්‍රදේශ

**කොළඹ සහ අවට වෙළෙඳපොළවල්**

1. පිටකොටුව
2. නාරාහේන්පිට
3. දෙමටගොඩ
4. තොටලඟ
5. පෑලියගොඩ
6. කඩවත
7. කිරිබත්ගොඩ
8. වැල්ලවත්ත
9. කිරුළපන
10. නුගේගොඩ

**පිට පළාත් වෙළෙඳපොළවල්**

1. නුවරඑළිය
2. දඹුල්ල
3. මාතර
4. කුරුණෑගල
5. ඇඹිලිපිටිය
6. නුවර
7. මීගොඩ
8. කළුතර
9. දිවුලපිටිය
10. හම්බන්තොට
11. කැප්පෙටිපොළ
12. පුත්තලම
13. තඹුත්තේගම
14. අනුරාධපුරය
15. රත්නපුර
16. දෙහිඅත්තකණ්ඩිය
17. බදුල්ල
18. තිස්සමහාරාමය
19. නිකවැරටිය
20. පොලොන්නරුව
21. ගාල්ල
22. මන්නාරම
23. මඩකලපුව
24. ත්‍රිකුණාමලය
25. යාපනය
26. මුලතිව්
27. වව්නියාව
28. කිලිනොච්චිය
29. කෑගල්ල
30. අම්පාර
31. මොණරාගල

## 01. වී නිෂ්පාදනය
### භෝග තත්ත්වය

මෙවර 2019/20 මහ කන්නය ආරම්භයේ දී ඇති වූ ගංවතුර තත්ත්වය හේතුවෙන් නැගෙනහිර පළාත් හා මන්නාරම දිස්ත්‍රික්කයේ වී වගාවන් හානියට පත් වුව ද, සියළුම ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශවල ඉහළ වී වගා ප්‍රගතියක් පැවතීම හේතුවෙන්, වී නිෂ්පාදනයේ සතුටුදායක ප්‍රගතියක් අපේක්ෂා කළ හැකිවනු ඇත.

**වගුව 1.1 : 2019/20 මහ කන්නයේ වී වගාවේ ප්‍රගතිය (ජනවාරි මාසය අවසානය දක්වා)**

| දිස්ත්‍රික්කය/ ප්‍රදේශය | ඉලක්කගත බිම් ප්‍රමාණය (හෙක්.) | වගා ප්‍රගතිය (හෙක්.) | ප්‍රගතිය (%) | අපේක්ෂිත නිෂ්පාදනය (මෙ.ටො.) | ගංවතුර හේතුවෙන් හානි වූ බිම් ප්‍රමාණය (හෙක්.) | අපේක්ෂිත අහිමිවන අස්වනු ප්‍රමාණය (මෙ.ටො.) | සංශෝධිත අපේක්ෂිත නිෂ්පාදනය (මෙ.ටො.) |
|---|---|---|---|---|---|---|---|
| අනුරාධපුරය | 97,803 | 92,175 | 94 | 364,662 | 1,018 | 2,374 | 362,288 |
| පොලොන්නරුව | 34,598 | 34,586 | 100 | 155,130 | 814 | 2,858 | 152,272 |
| අම්පාර | 74977 | 74,026 | 99 | 336,648 | 2,776 | 8,341 | 328,307 |
| කුරුණෑගල | 87161 | 87,580 | 100 | 430,893 | - | - | 430,893 |
| හම්බන්තොට | 28641 | 26,532 | 93 | 430,898 | 428 | 693 | 132,829 |
| කොළඹ | 3,908 | 3,104 | 79 | 133,522 | - | - | 9,102 |
| ගම්පහ | 12,743 | 10,495 | 82 | 9,102 | - | - | 32,561 |
| කළුතර | 12,940 | 8,942 | 69 | 32,561 | - | - | 29,025 |
| ගාල්ල | 11,526 | 10,081 | 87 | 29,025 | - | - | 25,640 |
| මාතර | 15,689 | 12,111 | 77 | 25,640 | 177 | 211 | 41,616 |
| රත්නපුරය | 12,632 | 10,326 | 81 | 40,827 | - | - | 35,898 |
| කෑගල්ල | 8,080 | 5,847 | 72 | 35,898 | - | - | 23,117 |
| පුත්තලම | 22,926 | 20,583 | 90 | 23,117 | 1,052 | 3,289 | 67,918 |
| මහනුවර | 13,528 | 12,141 | 90 | 71,207 | - | - | 39,335 |
| මාතලේ | 19,923 | 21,164 | 106 | 39,335 | - | - | 90,406 |
| නුවරඑළිය | 5,762 | 4,198 | 73 | 90,406 | - | - | 9,982 |
| බදුල්ල | 21,913 | 17,678 | 81 | 9,982 | - | - | 67,168 |
| මොණරාගල | 36,941 | 33,100 | 90 | 67,168 | - | - | 136,888 |
| යාපනය | 11,500 | 10,372 | 90 | 136,888 | 451 | 412 | 26,004 |
| කිලිනොච්චි | 24,911 | 24,921 | 100 | 26,416 | 125 | 154 | 85,238 |
| වව්නියාව | 19,901 | 19,333 | 97 | 85,392 | 93 | 319 | 86,508 |
| මුලතිව් | 17,537 | 17,378 | 99 | 86,827 | 626 | 1,407 | 61,390 |
| මන්නාරම | 20,775 | 20,675 | 100 | 62,797 | 3,243 | 14,801 | 79,559 |
| ත්‍රිකුණාමලය | 42,371 | 40,387 | 95 | 94,360 | - | - | 164,710 |
| මඩකලපුව | 71,071 | 64,447 | 91 | 164,710 | 22,937 | 35,572 | 129,951 |
| උඩවලව | 10,113 | 10,943 | 108 | 165,523 | - | - | 53,577 |
| මහවැලි එච් | 22,000 | 22,382 | 102 | 53,577 | - | - | 88,096 |
| මහවැලි එච් 1 | 7,775 | 8,269 | 106 | 88,096 | - | - | 32,547 |
| මහවැලි බී | 17,808 | 20,585 | 116 | 32,547 | - | - | 83,493 |
| මහවැලි සී | 22,552 | 22,598 | 100 | 83,493 | - | - | 91,657 |
| මහවැලි ජී | 4,629 | 4,537 | 98 | 91,657 | - | - | 18,402 |
| මහවැලි ඩී | 780 | 1,059 | 136 | 18,402 | | - | 4,033 |
| රඹකැන්ඔය | 2,783 | 2,885 | 104 | 4,033 | | - | 10,132 |
| මහවැලි එල් | 1,523 | 1,520 | 100 | 10,132 | | - | 6,165 |
| **ශ්‍රී ලංකාව** | 819,821 | 776,962 | 95 | 3,106,137 | 33,738 | 70,433 | 3,035,704 |

*මූලාශ්‍රය : කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ භෝග පුරෝකථන වාර්තාව*

මාසය තුළ දී නැගෙනහිර පළාතේ නිෂ්පාදන ප්‍රදේශවල සහ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වී අස්වනු නෙළීමේ කටයුතු සිදු වූ අතර, මෙම ප්‍රදේශවලින් අලුත් වී අස්වනු වෙළෙඳපොළට ලැබීම සිදු විය. මාසය පුරාම පාහේ පැවති වියළි කාළගුණික තත්ත්වය අස්වනු නෙළීමේ කටයුතුවලට හිතකරව පැවතුණි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නවතම භෝග පුරෝකථන වාර්තාවට අනුව මෙවර වගා වූ හෙක්.776,962ක බිම් ප්‍රමාණය පසුගිය කන්න 03ක සාමාන්‍යය වගා බිම් ප්‍රමාණයට වඩා 63%කින් ඉහළ ගොස් තිබුණි. වගා

හානිවීම් ඉවත් කළ පසු අපේක්ෂිත වී නිෂ්පාදනය මෙ.ටො දශ ලක්ෂ 3.04ක් විය. මාර්තු මස අග භාගයේදී වී අස්වනු නෙළීමේ කටයුතු වඩාත් තීව්‍ර වනු ඇතැයි අපේක්ෂා කල හැක.

**වගුව1.2 : වී සඳහා ගොවියාට ලැබුණු මිල - 2020 පෙබරවාරි**

| වර්ගය/ ප්‍රදේශය | මිල පරාසය | | සාමාන්‍ය මිල | | | මිල වෙනස්වීම | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | **2020** පෙබ. | **2020** ජන. | **2020** පෙබ. | **2020** ජන. | **2019** පෙබ. | **2020** ජන. | | **2019** පෙබ. | |
| | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු | කි.ග්‍රෑ.රු | % | කි.ග්‍රෑ.රු | % |
| **කෙටි වී (සම්බා)** | | | | | | | | | |
| අනුරාධපුරය | 36.00-50.00 | 35.00-53.00 | 44.02 | 45.32 | 36.52 | *-1.30* | *-2.87* | *7.50* | *20.53* |
| පොලොන්නරුව | 40.62-53.10 | 39.06-53.90 | 44.29 | 51.13 | 33.17 | *-6.85* | *-13.39* | *11.12* | *33.52* |
| කලාවැව | 37.00-48.00 | 38.00-53.00 | 42.75 | 47.31 | 32.92 | *-4.56* | *-9.65* | *9.83* | *29.87* |
| කුරුණෑගල | 37.00-50.00 | 36.00-55.00 | 44.50 | 48.66 | 35.87 | *-4.16* | *-8.54* | *8.63* | *24.04* |
| දෙහිඅත්තකණ්ඩිය | 40.00-51.60 | 40.63-52.00 | 45.98 | 49.22 | *36.33* | *-3.24* | *-6.58* | *9.65* | *26.55* |
| නිකවැරටිය | 38.00-50.00 | 38.00-56.00 | 43.53 | 51.36 | - | *-7.83* | *-15.25* | - | - |
| අම්පාර | 40.00-48.00 | 40.00-58.00 | 45.92 | 47.03 | 31.99 | *-1.11* | *-2.36* | *13.93* | *43.53* |
| **සුදු දිග වී (නාඩු)** | | | | | | | | | |
| අනුරාධපුරය | 36.00-45.00 | 35.00-55.00 | 42.19 | 45.77 | 32.86 | *-3.58* | *-7.82* | *9.33* | *28.41* |
| පොලොන්නරුව | 39.06-48.50 | 36.71-53.51 | 43.30 | 49.47 | 30.94 | *-6.17* | *-12.46* | *12.36* | *39.96* |
| කලාවැව | 36.00-46.00 | 35.00-55.00 | 40.71 | 47.97 | 30.54 | *-7.26* | *-15.14* | *10.17* | *33.29* |
| කුරුණෑගල | 37.00-48.00 | 36.00-55.00 | 44.25 | 48.61 | 30.71 | *-4.36* | *-8.98* | *13.54* | *44.10* |
| දෙහිඅත්තකණ්ඩිය | 39.00-50.00 | 35.16-52.00 | 44.00 | 48.17 | 33.21 | *-4.17* | *-8.67* | *10.79* | *32.49* |
| ඇඹිලිපිටිය | - | - | - | - | - | - | - | - | - |
| නිකවැරටිය | 37.00-46.00 | 37.00-56.00 | 43.00 | 51.05 | - | *-8.05* | *-15.77* | - | - |
| මාතර | - | - | - | - | - | - | - | - | - |
| හම්බන්තොට | - | - | - | - | - | - | - | - | - |
| අම්පාර | 35.00-49.00 | 35.00-58.00 | 45.29 | 44.77 | - | *0.52* | *1.15* | - | - |
| **දිග වී (රතු)** | | | | | | | | | |
| අනුරාධපුරය | - | - | - | - | - | - | - | - | - |
| මාතර | 43.00-50.00 | 50.00-58.00 | 46.83 | 54.10 | 0.00 | *-7.27* | *-13.43* | - | - |
| හම්බන්තොට | 41.00-50.00 | 40.00-55.00 | 47.17 | 51.00 | 34.90 | *-3.83* | *-7.52* | *12.27* | *35.16* |
| ඇඹිලිපිටිය | 47.00-51.00 | 52.00-60.00 | 48.25 | 57.08 | 35.27 | *-8.83* | *-15.46* | *12.98* | *36.79* |

*මූලාශ්‍රය : අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය*

## වී ගොවියාට ලැබුණු මිල

රජය මඟින් ක්‍රියාත්මක කළ නවතම සහතික වී මිල හේතුවෙන් වී සඳහා ගොවිපල මිල ගණන් සියලුම ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශවල පාහේ පසුගිය වසරට සාපේක්ෂව 30%ට වැඩි අගයන්ගෙන් ඉහළ ගොස් තිබුණි. ඉහළ මට්ටමක පැවති වී මිල ගණන් මාසය ආරම්භක කොටසේ දී පහළ යාමේ ප්‍රවණතාවයක් පෙනුන්ම් කෙරුණි. නැගෙනහිර පළාත තුළ මහ කන්නයේ වී අස්වනු නෙළීම සිදුවීමත් සමඟ, තෙතමනය ප්‍රතිශතය වැඩි වී තොග වෙළෙඳපොළවලට ලැබීම මිල පහළ යාමට හේතු විය. බොහොමයක් ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශවල සුදු දිග වී මිල ගණන් 8%-16% අතර පරාසයන්ගෙන් පහළ ගොස් තිබුණි. කෙසේ වුවද, මෙරට සුදු දිග වී වැඩිම අතිරික්තය සපයන අම්පාර දිස්ත්‍රික්කයේ වී මිල 1%ට වැඩි අගයකින් ඉහළ ගොස් තිබුණි. රජය මඟින් මෙවර මහ කන්නයේ දිග වී සහ කෙටි වී යන දෙවර්ගය සඳහා ම කිලෝවකට රු.50.00 වශයෙන් සහතික මිලක් නියම කරන ලදී. එමෙන් ම තෙතමනය ප්‍රතිශතය වැඩි වී සහ 14% තෙතමනය සහිත හොඳින් වියළුණු වී සඳහා ද්විත්ව සහතික මිල ක්‍රමයක් ඇති කරන ලද අතර, ඒ තුළින් ගොවියාට ලැබෙන මිල ස්ථාවර කිරීම ප්‍රධාන වශයෙන් අරමුණු කරන ලදී. මාසය තුළ දී සුදු දිග වී මිල කිලෝවක් සඳහා රු.35.00-50.00 අතර පැවතුණි. එමෙන් ම කෙටි වී මිල කිලෝවක් සඳහා රු.36.00-53.00ක් දක්වා පැවති අතර වැඩිම මිල පොලොන්නරුවෙන් වාර්තා විය. රතු දිග වී මිල කිලෝවක් සඳහා දකුණු පළාතේ නිෂ්පාදන ප්‍රදේශවල රු.41.00-51.00 අතර පැවතුණි. රජය මඟින් නව සහතික මිල යටතේ වී මිල දී ගැනීම සිදුවීමත් සමග ඉදිරි මාසය තුළ දී වී මිල ගණන් තවදුරටත් ස්ථාවර වනු ඇතැයි අපේක්ෂා කළ හැක.

පසුගිය වසරේ සමාන කාලයට සාපේක්ෂව කෙටි වී, සුදු දිග වී සහ රතු වී මිල ගණන් පිළිවෙළින් 21%-44%, 28%-44% සහ 35%-37% පරාසයන්ගෙන් ඉහළ ගොස් තිබුණි.

## ඉල්ලුම / සැපයුම සහ මිල හැසිරීම

### සහල් තොග මිල

මාසයේ ආරම්භයත් සමඟ (පෙබරවාරි 2020) බොහොමයක් වී නිෂ්පාදන ප්‍රදේශවල 2019/20 මහ කන්නයේ අස්වනු නෙළීම් ආරම්භ වී තිබුණි. මේ හේතුවෙන් සියළුම සහල් වර්ගවල සැපයුම පසුගිය මාසයට සාපේක්ෂව ඉහළ ගොස් තිබුණි. සැපයුම ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස සියළුම සහල් වර්ගවල තොග මිල පහළ ගිය අතර, උපරිම මිල පහළ යාම වූ කිලෝවක රු.13.89ක් රතු කැකුළු සහල් සඳහා සටහන් විය. කොළඹ සහල් තොග වෙළෙඳපොළෙහි රතු කැකුළු සහල් මිල රු.85.00-98.00 අතර පරාසයක පෙබරවාරි මාසය තුළ පැවතුණි. එමෙන් ම දෙවන ශ්‍රේණියේ නාඩු සහ සම්බා සහල් තොග මිල පිළිවෙළින් 4% සහ 2%ක සුළු පහළ යාමක් පසුගිය මාසයට සාපේක්ෂව සටහන් විය.

පසුගිය වසරේ සමාන කාලය සමඟ සැසඳීමේ දී, බොහොමයක් සහල් වර්ගවල තොග මිල ගණන් ඉහළ ගොස් ඇති අතර උපරිම මිල ඉහළ යාම 31%ක් ලෙස රතු කැකුළු සඳහා සටහන් විය. තවද, පසුගිය වර්ෂයට සාපේක්ෂව දෙවන ශ්‍රේණියේ නාඩු සහ සුදු කැකුළු සහල් තොග මිල 19%කින් ඉහළ ගොස් තිබුණි.

2020 පෙබරවාරි මාසය තුළ සහල් මෙ.ටො. 2,847ක් ආනයනය කර තිබුණි. ඒ සඳහා රුපියල් දශ ලක්ෂ 264.3ක් වැය වී ඇත. බාස්මතී සහල් මාසය තුළ වැඩි වශයෙන් ආනයනය කළ සහල් ලෙස සටහන් විය.

## සහල් සිල්ලර

**වගුව 1.3 : සහල් මිල (තොග සහ සිල්ලර ) – 2020 පෙබරවාරි**

| වර්ගය | මිල පරාසය | සාමාන්‍ය මිල | | | මිල වෙනස්වීම | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2020 පෙබ. | 2020 පෙබ. | 2020 ජන. | 2019 පෙබ. | 2020 ජන. | | 2019 පෙබ. | |
| | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු. | % | කි.ග්‍රෑ.රු | % |
| **තොග මිල** | | | | | | | | |
| සම්බා 1 | 96.00-97.00 | 96.07 | - | 106.66 | - | - | *-10.60* | *-9.93* |
| සම්බා 2 | 90.00-95.00 | 93.18 | 94.60 | 91.14 | *-1.43* | *-1.51* | *2.03* | *2.23* |
| සම්බා 3 | - | - | - | - | - | - | - | - |
| නාඩු 1 | 96.00-97.00 | 96.07 | - | 90.00 | - | - | *6.07* | *6.74* |
| නාඩු 2 | 88.00-93.00 | 90.98 | 94.66 | 76.26 | *-3.68* | *-3.89* | *14.72* | *19.30* |
| රතු කැකුළු | 85.00-98.00 | 89.00 | 102.89 | 67.83 | *-13.89* | *-13.50* | *21.18* | *31.22* |
| සුදු කැකුළු | 85.00-95.00 | 88.63 | 97.55 | 74.30 | *-8.93* | *-9.15* | *14.33* | *19.28* |
| ආනයනික පොන්නි සම්බා | - | - | - | - | - | - | - | - |
| ආනයනික සුදු කැකුළු | - | - | - | - | - | - | - | - |
| ආනයනික නාඩු | - | - | - | - | - | - | - | - |
| **සිල්ලර මිල** | | | | | | | | |
| සම්බා 1 | 98.00-98.00 | 98.00 | 98.00 | 116.14 | *0.00* | *0.00* | *-18.14* | *-15.62* |
| සම්බා 2 | - | - | - | 107.65 | - | - | - | - |
| සම්බා 3 | - | - | - | - | - | - | - | - |
| නාඩු 1 | 98.00-98.00 | 98.00 | 98.00 | 94.64 | *0.00* | *0.00* | *3.36* | *3.55* |
| නාඩු 2 | - | - | - | 88.03 | - | - | - | - |
| රතු කැකුළු | 90.00-110.00 | 104.20 | 110.60 | 82.07 | *-6.40* | *-5.79* | *22.12* | *26.96* |
| සුදු කැකුළු | 95.00-110.00 | 104.75 | 108.50 | 87.74 | *-3.76* | *-3.46* | *17.01* | *19.38* |
| ආනයනික පොන්නි සම්බා | - | - | - | 160.91 | - | - | - | - |
| ආනයනික සුදු කැකුළු | - | - | - | - | - | - | - | - |
| ආනයනික නාඩු | - | - | - | - | - | - | - | - |

*මූලාශ්‍රය: අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය, හෙ.කො.ගො.ප.පු.ආයතනය*

සියළුම සහල් වර්ගවල තොග මිල ගණන් පහළ දෙසට නැඹුරු වීමේ ප්‍රවණතාවයක් පෙන්වුව ද සම්බා හා නාඩු සහල් සඳහා වූ සිල්ලර මිල රජය විසින් 2019 දෙසැම්බර් 19 වන දින ප්‍රකාශයට පත් කළ උපරිම සිල්ලර මිල (කිලෝවක් සඳහා රු.98.00) මට්ටමේ නොවෙනස්ව පැවතුණි. කෙසේ නමුත්, රතු කැකුළු සහ සුදු කැකුළු සහල් කිලෝවක් සඳහා වූ සිල්ලර මිල පිළිවෙළින් රු.6.40 සහ රු.3.76කින් පහළ ගොස් තිබුණි. රතු කැකුළු

සහ සුදු කැකුළු කිලෝවක සිල්ලර මිල පිළිවෙළින් රු.90.00-110.00 සහ රු.95.00-110.00 අතර පරාසයෙහි පැවතුණි.

පසුගිය වසරෙහි සමාන කාලය සමඟ සැසඳීමේ දී, බොහොමයක් සහල් වර්ගවල සිල්ලර මිල ගණන් ඉහළ ගොස් ඇති අතර උපරිම මිල ඉහළ යාම වූ 27%ක් රතු කැකුළු සහල් සඳහා සටහන් විය. සුදු කැකුළු සඳහා එය 19%ක මිල ඉහළ යාමකි.

# 2. අතිරේක ආහාර භෝග

## 2.1 මිරිස්

### භෝග තත්ත්වය

2019/20 මහ කන්නයට අදාළව දිවයිනේ ඉලක්කගත අමු මිරිස් බිම් ප්‍රමාණය හෙක් 10,481ක් වූ අතර පසුගිය මස අවසානය වන විට ඉන් හෙක්.6, 399 ක වගාව අවසන් කර තිබුණි. මෙම කන්නය තුළ ද ඉහළම ඉලක්කගත බිම් ප්‍රමාණය (හෙක්.2,986) හා ඉහළම බිම් ප්‍රමාණය (හෙක්.1471) වාර්තා වූයේ අනුරාධපුර දිස්ත්‍රික්කයෙනි. ජනවාරි මාසය අවසානය වන විට වගා කර ඇති බිම් ප්‍රමාණය අනුව අපේක්ෂිත අමු මිරිස් අස්වනු ප්‍රමාණය මෙ.ටො. 31,188ක් වූ අතර, ඉන් 51%ක් ම අනුරාධපුර (24%), පුත්තලම (14%) හා මොණරාගල (13%) යන දිස්ත්‍රික්කවලින් සැපයේ.

**වගුව 2.1.1: 2019/20 මහ කන්නය සඳහා අමු මිරිස් වගාවේ ප්‍රගතිය**

| ප්‍රදේශයන් | ඉලක්කගත බිම් ප්‍රමාණය (හෙක්.) | 2020 ජනවාරි මස අවසානයට වගා ප්‍රගතිය | | අපේක්ෂිත නිෂ්පාදනය (මෙ.ටො.) |
|---|---|---|---|---|
| | | වගා බිම් ප්‍රමාණය (හෙක්.) | ඉලක්කයේ % ලෙස | |
| අනුරාධපුරය | 2,986 | 1,471 | 49 | 7,560 |
| පුත්තලම | 835 | 499 | 60 | 4,413 |
| මොණරාගල | 790 | 612 | 77 | 4,092 |
| යාපනය | 568 | 254 | 45 | 1,578 |
| බදුල්ල | 429 | 358 | 83 | 1,156 |
| අම්පාර | 499 | 314 | 63 | 1,001 |
| මඩකලපුව | 374 | 313 | 84 | 1,329 |
| කුරුණෑගල | 254 | 205 | 81 | 1,110 |
| අනෙකුත් ප්‍රදේශ | 3,746 | 2,373 | 63 | 8,949 |
| එකතුව | 10,481 | 6,399 | 61 | 31,188 |

*මූලාශ්‍රය : භෝග පුරෝකථන වාර්තාව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව*

### ඉල්ලුම / සැපයුම සහ මිලෙහි හැසිරීම

ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශවලින් අමු මිරිස් තොග සැපයුම මෙම මාසය තුළ ඉහළ ගොස් තිබුණි. ඒ අනුව ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශවලින් වාර්තා වූ ගොවිපළ මිල ගණන්හිදී ද ක්‍රමික පහළ යාමක් මෙම මාසයේ දෙවැනි සතියේ සිට පැවතුණි. ඒ අනුව, අමු මිරිස් තොග හා සිල්ලර මිල ගණන් පිළිවෙළින් රු.76.00ක් හා රු.91.00ක් වශයෙන් පහළ ගොස් තිබුණි. අමු මිරිස් කිලෝවක තොග හා සිල්ලර මිල ගණන් පිළිවෙළින් රු.162.25ක් හා රු.341.46ක් වශයෙන් වාර්තා වූ අතර, පසුගිය වසරට සාපේක්ෂව එම මිල ගණන් පිළිවෙළින් 4%ක් හා 6%ක් වශයෙන් ඉහළ ගොස් තිබුණි.

2020 පෙබරවාරි මාසය තුළ වියළි මිරිස් මෙ.ටො. 5,131ක් ඉන්දියාවෙන් ආනයනය කර ඇති අතර, එය පසුගිය මාසයට සාපේක්ෂව මෙ.ටො.2,051ක ඉහළ යාමකි. වියළි මිරිස් කිලෝවක සාමාන්‍යය ආනයනික මිල රු.387.33ක් වූ අතර, පසුගිය මාසයට සාපේක්ෂව එහි සැලකිය යුතු වෙනසක් වාර්තා නොවේ. ආනයනික වියළි මිරිස් තොග හා සිල්ලර මිල ගණන් පිළිවෙළින් රු.22.16ක් හා රු.48.03ක් වශයෙන් ඉහළ ගොස් ඇත. ආනයනික වියළි මිරිස් කිලෝවක සමාන්‍යය තොග මිල රු.520.10ක් ලෙස ද, සිල්ලර මිල රු.616.91ක් වශයෙන් ද වාර්තා වූ අතර, පසුගිය වසරට සාපේක්ෂව එම මිල ගණන් පිළිවෙළින් 89%ක් හා 84%ක් වශයෙන් ඉහළ ගොස් ඇත.

### වගුව 2.1.2 : අමු මිරිස් සඳහා ගොවියාට ලැබුණු මිල (කි.ග්‍රෑ.රු.)- 2020 පෙබරවාරි

| ප්‍රදේශය | 1 සතිය | 2 සතිය | 3 සතිය | 4 සතිය |
|---|---|---|---|---|
| දඹුල්ල | 164.00 | 146.50 | 110.00 | 113.00 |
| හම්බන්තොට | 275.00 | 275.00 | - | - |
| ඇඹිලිපිටිය | 281.00 | 277.00 | 178.00 | 175.00 |
| පුත්තලම | 205.00 | 138.00 | 110.00 | 128.00 |
| අනුරාධපුර | 276.67 | 240.00 | 130.00 | 100.00 |

*මූලාශ්‍රය: අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය, හෙ.කො.ගො.ප.පු.ආයතනය*

### වගුව 2.1.3 : වියළි මිරිස් හා අමු මිරිස් තොග සහ සිල්ලර මිල - 2020 පෙබරවාරි

| වර්ගය | මිල පරාසය | සාමාන්‍ය මිල | | | මිල වෙනස්වීම | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | **2020** පෙබ. | **2020** පෙබ. | **2020** ජන. | **2019** පෙබ. | **2020** ජන. | | **2019** පෙබ. | |
| | කි. ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු. | % | කි.ග්‍රෑ.රු. | % |
| **තොග මිල** | | | | | | | | |
| අමු මිරිස් | 100.00-250.00 | 162.25 | 238.00 | 169.58 | *-75.75* | *-31.83* | *-7.33* | *-4.32* |
| වියළි මිරිස් (ආනයනික) | 420.00-600.00 | 520.10 | 497.94 | 275.46 | *22.16* | *4.45* | *244.64* | *88.81* |
| **සිල්ලර මිල** | | | | | | | | |
| අමු මිරිස් | 140.00-500.00 | 341.46 | 432.08 | 320.81 | *-90.62* | *-20.97* | *20.64* | *6.43* |
| වියළි මිරිස් (ආනයනික) | 540.00-700.00 | 616.91 | 568.88 | 335.00 | *48.03* | *8.44* | *281.91* | *84.15* |

*මූලාශ්‍රය: අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය, හෙ.කො.ගො.ප.පු.ආයතනය*

### වගුව 2.1.4: වියළි මිරිස්වල ආනයනික මිල තොග සහ සිල්ලර මිල (කි.ග්‍රෑ.රු) 2019 සැප්. - 2020 පෙබරවාරි

| මාසය | ප්‍රමාණය (මෙ.ටො.) | වටිනාකම (රු.දශ ලක්ෂ) | ආනයනික මිල (මි.ර.ගැ) (කි.ග්‍රෑ.රු.) | සිල්ලර මිල (කි.ග්‍රෑ.රු.) | දළ ආන්තිකය* (කි.ග්‍රෑ.රු.) |
|---|---|---|---|---|---|
| පෙබ.2020 | 5,131 | 1,987.4 | 387.33 | 616.91 | 229.58 |
| ජන. 2020 | 3,080 | 1,192.4 | 387.11 | 568.88 | 181.77 |
| දෙසැ.2019 | 5,178 | 1,906.7 | 368.21 | 518.89 | 150.68 |
| නොවැ. 2019 | 4,700 | 1,700.5 | 361.82 | 502.09 | 140.27 |
| ඔක්.2019 | 4,053 | 1,456.9 | 359.50 | 484.80 | 125.30 |
| සැප්.2019 | 5,086 | 1,672.2 | 328.77 | 434.22 | 105.46 |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව*
*අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය, හෙ.කො.ගො.ප.පු.ආයතනය*
*(මි.ර.ගැ. = මිල, රක්ෂණය සහ ගැල් කුලී)*
* සිල්ලර මිල - ආනයනික මිල

## 2.2 ලොකු ලූනු සහ රතු ලූනු

## භෝග තත්ත්වය

ජනවාරි මස අවසානය වන විට 2019/20 මහ කන්නය සඳහා රතු ලූනු හෙක්. 2,150ක් වගා කර තිබූ අතර, එය දිවයිනේ ඉලක්කගත රතු ලූනු බිම් ප්‍රමාණයෙන් 55%කි. යාපනය දිස්ත්‍රික්කය තුළ පසුගිය මස අවසානය වන විට හෙක්.1,340ක් වගා කර තිබූ අතර එය එම දිස්ත්‍රික්කයේ ඉලක්කගත බිම් ප්‍රමාණයෙන් 71% කි. පුත්තලම දිස්ත්‍රික්කය තුළ මෙම මහ කන්නය සඳහා හෙක්. 710ක බිම් ප්‍රමාණයක් රතු ලූනු වගාව සඳහා ඉලක්ක කර තිබූ අතර ජනවාරි අවසානය වන විට ඉන් 61%ක වගාව අවසන් කර තිබුණි. මෙම කන්නයට අදාළව අපේක්ෂිත රතු ලූනු නිෂ්පාදන ප්‍රමාණය මෙ.ටො. 31,983ක් වූ අතර ඉන් 86%ක්ම සැපයෙන්නේ යාපනය (58%) හා පුත්තලම (28%) යන දිස්ත්‍රික්කවලිනි.

### වගුව 2.2.1: 2019/20 මහ කන්නය සඳහා රතු ලූනු වගාවේ ප්‍රගතිය

| ප්‍රදේශයන් | ඉලක්කගත බිම් ප්‍රමාණය (හෙක්.) | 2019 ජන. අවසානය වන විට වගා ප්‍රගතිය | | අපේක්ෂිත නිෂ්පාදනය (මෙ.ටො) |
|---|---|---|---|---|
| | | වගා බිම් ප්‍රමාණය (හෙක්.) | ඉලක්කයේ % ලෙස | |
| යාපනය | 1,900 | 1,340 | 71 | 18,580 |
| පුත්තලම | 710 | 433 | 61 | 9,039 |
| ත්‍රිකුණාමලය | 753 | 163 | 22 | 1,872 |
| මුලතිව් | 83 | 54 | 65 | 669 |
| අනෙකුත් ප්‍රදේශ | 489 | 160 | 33 | 1,823 |
| එකතුව | 3,935 | 2,150 | 55 | 31,983 |

*මූලාශ්‍රය: භෝග පුරෝකථන වාර්තාව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව*

## ඉල්ලුම / සැපයුම සහ මිලෙහි හැසිරීම

වෙළෙඳපොළ ආනයනික ලොකු ලූනු වලින් පමණක් සමන්විත විය. මෙම මාසය තුළ ලොකු ලූනු මෙ.ටො.16,421ක් පාකිස්ථානයෙන් ආනයනය කර ඇති අතර, එය පසුගිය මාසයට සාපේක්ෂව මෙ.ටො. 6,213ක පහළ යාමකි. ලොකු ලූනු කිලෝවක සාමාන්‍යය ආනයනික මිල රු.91.81ක් වූ අතර එය පසුගිය ජනවාරි මාසයට සාපේක්ෂව කිලෝවකට රු.4.32ක පහළ යාමකි. ආනයනික ලොකු ලූනු තොග හා සිල්ලර මිල ගණන් පිළිවෙළින් රු.40.00ක් හා රු.29.00ක් වශයෙන් ඉහළ ගොස් තිබුණි. ආනයනික ලොකු ලූනු කිලෝවක සාමාන්‍යය තොග මිල රු.140.63ක් ලෙස ද, සිල්ලර මිල රු.187.64ක් වශයෙන් ද වාර්තා වූ අතර පසුගිය වසරට සාපේක්ෂව එම මිල ගණන් 170%ක් හා 131% වශයෙන් ඉහළ යාමක් වාර්තා කරන ලදී.

### වගුව 2.2.2: රතු ලූනු සහ ලොකු ලූනු තොග සහ සිල්ලර මිල (කි.ග්‍රෑ.රු) 2020 - පෙබරවාරි

| වර්ගය | මිල පරාසය | සාමාන්‍ය මිල | | | මිල වෙනස්වීම | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2020 පෙබ. | 2020 පෙබ. | 2020 ජන. | 2019 පෙබ. | 2020 ජන. | | 2019 පෙබ. | |
| | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු. | % | කි.ග්‍රෑ.රු | % |
| **තොග මිල** | | | | | | | | |
| රතු ලූනු (සිනන්) | 250.00-420.00 | 321.72 | 340.00 | 108.63 | *-18.28* | *-5.38* | *213.09* | *196.16* |
| රතු ලූනු (වේදාලන්) | 340.00-420.00 | 376.67 | - | 102.86 | - | - | *273.81* | *266.20* |
| රතු ලූනු (ආනයනික) | 280.00-430.00 | 326.54 | 418.88 | 116.79 | *-92.33* | *-22.04* | *209.75* | *179.60* |
| ලොකු ලූනු (ආනයනික) | 70.00-250.00 | 140.63 | 100.21 | 52.07 | *40.42* | *40.33* | *88.56* | *170.08* |
| ලොකු ලූනු (දේශීය) | - | - | - | - | - | - | - | - |
| **සිල්ලර මිල** | | | | | | | | |
| රතු ලූනු (සිනන්) | - | - | - | 176.36 | - | - | - | - |
| රතු ලූනු (වේදාලන්) | 560.00-600.00 | 589.00 | - | - | - | - | - | - |
| රතු ලූනු (ආනයනික) | 360.00-600.00 | 489.95 | 594.62 | 190.21 | *-104.67* | *-17.60* | *299.74* | *157.58* |
| ලොකු ලූනු ආනයනික) | 120.00-280.00 | 187.64 | 158.34 | 81.33 | *29.30* | *18.50* | *106.31* | *130.71* |
| ලොකු ලූනු (දේශීය) | - | - | - | - | - | - | - | - |

*මූලාශ්‍රය: අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය, හෙ.කො.ගො.ප.පු.ආයතනය*

යාපනය හා පුත්තලම දිස්ත්‍රික්කවලින් රතු ලූනු සැපයුම මෙම මාසය තුළ ඉහළ ගොස් තිබුණි. ඒ අනුව, සිනන් රතු ලූනු කිලෝවක තොග මිල රු.18.00කින් පහළ ගොස් තිබුණි. වේදාලන් රතු ලූනු කිලෝවක තොග හා සිල්ලර මිල ගණන් පිළිවෙළින් රු.376.67ක් හා රු.589.00ක් ලෙස වෙළෙඳපොළේ පැවතුණි. සිනන් වර්ගයේ රතු ලූනු සිල්ලර වෙළෙඳපොළවල දක්නට නොවීය.

2020 පෙබරවාරි මාසය තුළ රතු ලූනු මෙ.ටො. 1,134ක් තායිලන්තයෙන් ආනයනය කර ඇති අතර, පසුගිය මාසයට සාපේක්ෂව එය මෙ.ටො. 521ක ඉහළ යාමකි. රතු ලූනු කිලෝවක සාමාන්‍යය ආනයනික මිල රු.227.44ක් වන අතර එය පසුගිය මාසයට සාපේක්ෂව කිලෝවකට රු.38.19ක පහළ යාමකි. ආනයනික රතු ලූනු තොග හා සිල්ලර මිල ගණන් පිළිවෙළින් රු.92.00ක් හා රු.105.00ක් වශයෙන් පහළ ගොස් ඇත. පසුගිය වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව ආනයනික රතු ලූනු තොග හා සිල්ලර මිල ගණන් පිළිවෙළින් 180%ක් හා 158% වශයෙන් ඉහළ ගොස් ඇත.

**වගුව 2.2.3: ආනයනික ලූනු වල මාසික සාමාන්‍ය ආනයනික මිල (මි.ර.ගැ) තොග සහ සිල්ලර මිල**

| භෝගය | මාසය | ආනයනික මිල (මි.ර.ගැ.) (කි.ග්‍රෑ.රු.) | තොග මිල (කි.ග්‍රෑ.රු.) | සිල්ලර මිල (කි.ග්‍රෑ.රු.) | දළ ආන්තිකය (කි.ග්‍රෑ.රු.) | |
|---|---|---|---|---|---|---|
| | | | | | තොග මිල - ආනයනික මිල | සිල්ලර මිල - තොග මිල |
| ලොකු ලූනු | 2020 පෙබ. | 91.81 | 140.63 | 187.64 | *48.81* | *47.02* |
| | 2020 ජන. | 96.13 | 100.21 | 158.34 | *4.08* | *58.14* |
| | 2019 පෙබ. | 33.58 | 52.07 | 81.33 | *18.49* | *29.26* |
| රතු ලූනු | 2020 පෙබ. | 227.44 | 326.54 | 489.95 | *99.10* | *163.41* |
| | 2020 ජන. | 265.63 | 418.88 | 594.62 | *153.25* | *175.74* |
| | 2019 පෙබ. | 84.86 | 116.79 | 190.21 | *31.93* | *73.42* |

*මූලාශ්‍රය :ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව සහ අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය, හෙ.කො.ගො.ප.පු.ආයතනය*

**වගුව 2.2.4: රතු ලූනු සහ ලොකු ලූනු ආනයනික ප්‍රමාණය, වටිනාකම සහ ආනයනික මිල**

| භෝගය | ප්‍රමාණය (මෙ.ටො.) | | වටිනාකම (රු.දශ ලක්ෂ) | | ආනයනික මිල මි.ර.ගැ. (කි.ග්‍රෑ.රු.) | |
|---|---|---|---|---|---|---|
| | **2020 පෙබ.** | **2020 ජන.** | **2020 පෙබ.** | **2020 ජන.** | **2020 පෙබ.** | **2020 ජන.** |
| රතු ලූනු | 1,134 | 1,655 | 257.9 | 439.6 | 227.44 | 265.63 |
| ලොකු ලූනු | 16,421 | 22,634 | 1,507.7 | 2,175.7 | 91.81 | 96.13 |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව*

**වගුව 2.2.5 : ආනයනික ලොකු ලූනු වල ආනයනික මිල (මි.ර.ගැ.) තොග සහ සිල්ලර මිල 2019 සැප්. - 2020 පෙබරවාරි**

| මාසය | ප්‍රමාණය (මෙ.ටොන්) | ආනයනික මිල මි.ර.ගැ. ( කි.ග්‍රෑ.රු.) | තොග මිල කි.ග්‍රෑ.රු. | සිල්ලර මිල කි.ග්‍රෑ.රු. | දළ ආන්තිකය* කි.ග්‍රෑ.රු. |
|---|---|---|---|---|---|
| පෙබ.2020 | 16,421 | 91.81 | 140.63 | 187.64 | 95.83 |
| ජන. 2020 | 22,634 | 96.13 | 100.21 | 158.34 | 62.22 |
| දෙසැ.2019 | 29,000 | 101.53 | 126.44 | 178.67 | 77.15 |
| නොවැ. 2019 | 25,961 | 83.78 | 125.63 | 192.69 | 108.91 |
| ඔක්.2019 | 20,928 | 91.48 | 179.63 | 248.02 | 156.54 |
| සැප්.2019 | 5,171 | 109.24 | 155.81 | 167.17 | 57.92 |

*මූලාශ්‍රය :ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව සහ අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය, හෙ.කො.ගො.ප.පු.ආයතනය*
**සිල්ලර මිල - ආනයනික මිල*

## 2.3 අර්තාපල්

### භෝග තත්ත්වය

2019/20 මහ කන්නය සඳහා ඉලක්කගත අර්තාපල් වගා බිම් ප්‍රමාණය හෙක්. 2,686 වූ අතර, ජනවාරි මස අවසන් වන විට හෙක්. 1,330ක් වගා කර තිබුණි. එය ඉලක්කගත බිම් ප්‍රමාණයෙන් 50% කි. ජනවාරි මාසයේ දී රට තුළ සමස්තයක් ලෙස අර්තාපල් හෙක්. 371ක් වගා කර තිබුණි. පසුගිය මහ කන්නයේ සමාන කාලය හා සැසඳීමේ දී මෙම මහ කන්නයේ ජනවාරි මස අග වන විට වගා කරන ලද බිම් ප්‍රමාණය අඩු මට්ටමක පවතී. ජනවාරි මස අග දක්වා වගා කරන ලද බිම් ප්‍රමාණය සැලකීමේ දී මෙවර මහ කන්නය සඳහා අපේක්ෂිත අර්තාපල් නිෂ්පාදනය මෙ.ටො. 21,415 කි.

නුවරඑළිය දිස්ත්‍රික්කයෙහි මෙම මහ කන්නය සඳහා ඉලක්කගත බිම් ප්‍රමාණය හෙක්.1,132 ක් වූ අතර, ජනවාරි මස අවසන් වන විට හෙක්. 346ක් වගා කර තිබුණි (31% ප්‍රගතියකි). පසුගිය මහ කන්නයේ සමාන කාලය හා සැසඳීමේ දී දිස්ත්‍රික්කය තුළ මේ දක්වා වගාකොට ඇති බිම් ප්‍රමාණය පහළ මට්ටමක පවතින අතර, පැවැති

අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් නව වගා කටයුතු සඳහා බාධා ඇති වීම එයට හේතු විය. ජනවාරි මාසයේ දී නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ අර්තාපල් හෙක්. 101 ක් වගා කොට තිබුණි. බදුල්ල දිස්ත්‍රික්කයෙහි 2019/20 මහ කන්නය සඳහා ඉලක්කගත බිම් ප්‍රමාණය හෙක්. 1,432ක් වූ අතර, ජනවාරි මස අවසන් වන විට හෙක්. 856ක් වගා කොට තිබුණි. එය ඉලක්කගත බිම් ප්‍රමාණයෙන් 60% කි. පසුගිය මහ කන්නයෙහි සමාන කාලය හා සැසඳීමේ දී, දිස්ත්‍රික්කය තුළ මේ දක්වා වගාකොට ඇති බිම් ප්‍රමාණය අඩු මට්ටමක පවතී. ජනවාරි මාසයේ දී බදුල්ල දිස්ත්‍රික්කය තුළ අර්තාපල් හෙක්. 235 ක් වගා කොට තිබුණි. ක්ෂේත්‍ර තොරතුරු වලට අනුව බදුල්ල දිස්ත්‍රික්කයේ වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කැප්පෙටිපොළ, බෝගහකුඹුර, බොරලන්ද, අඹගස්දෝව සහ ඌවපරණගම ප්‍රදේශවල කඳු ආශ්‍රිතව වැඩි වශයෙන් අර්තාපල් වගාව ව්‍යාප්තව පැවතුණි. වැලිමඩ අර්තාපල් සඳහා අස්වනු නෙළීම් කටයුතු පෙබරවාරි මස අවසන් වන විට ආරම්භව පැවතුණි.

**වගුව 2.3.1 : අර්තාපල් සඳහා වගා ප්‍රගතිය (2019/20 මහ කන්නය )**

| දිස්ත්‍රික්කය | වගා ඉලක්කය (හෙක්.) | | වගා ප්‍රගතිය (හෙක්.) | | වගා ප්‍රගතිය (%) 2019/20 මහ | අපේක්ෂිත නිෂ්පාදනය (මෙ.ටො) |
|---|---|---|---|---|---|---|
| | 2018/19 මහ | 2019/20 මහ | 2018/19 මහ | 2019/20 මහ | | |
| නුවරඑළිය | 1,323 | 1,132 | 623 | 349 | 31 | 6,598 |
| බදුල්ල | 1,502 | 1,432 | 986 | 856 | 60 | 12,905 |
| **ශ්‍රී ලංකාව** | **2,964** | **2,686** | **1,706** | **1,330** | **50** | **21,415** |

*මූලාශ්‍රය: භෝග පුරෝකථන වාර්තාව, 2019 යලකන්නය, සමාජ- ආර්ථික ඒකකය / කෘෂිකර්ම දෙපාර්තමේන්තුව*

## ඉල්ලුම / සැපයුම සහ මිලෙහි හැසිරීම

පෙබරවාරි මාසයේ දී අර්තාපල් මෙ.ටො. 16,999 ක් ආනයනය කර තිබූ අතර, එය පසුගිය මාසයට සාපේක්ෂව මෙ.ටො. 2,348 ක ඉහළ යාමකි. අර්තාපල් සඳහා වන විශේෂිත ආනයනික බද්ද 2019/12/25 දින සිට ක්‍රියාත්මක වන පරිදි කිලෝවකට රු. 50.00 සිට රු. 25.00 දක්වා අඩු කිරීම මෙයට බලපාන ලදී. ආනයනික තොග ප්‍රධාන වශයෙන් පාකිස්ථානයෙන් (72%) හා ඉන්දියාවෙන් (28%) වෙළඳපොළට ලැබී තිබුණි.

**වගුව 2.3.2 : අර්තාපල් සඳහා ගොවියාට ලැබුණු මිල, තොග, සිල්ලර සහ ආනයනික මිල (2020 - පෙබරවාරි)**

| වර්ගය | මිල පරාසය | සාමාන්‍ය මිල | | | මිල වෙනස්වීම | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2020 පෙබ. | 2020 පෙබ. | 2020 ජන. | 2019 පෙබ. | 2020 ජන. | | 2019 පෙබ. | |
| | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු. | % | කි.ග්‍රෑ.රු. | % |
| **ගොවිපල මිල (1)** | | | | | | | | |
| වැලිමඩ | - | - | - | 90.20 | - | - | - | - |
| නුවරඑළිය | 100.00-135.00 | 116.30 | 149.00 | 99.75 | *-32.70* | *-28.12* | *16.55* | *14.23* |
| ආනයනික | 100.00-110.00 | 104.38 | 0.00 | 90.20 | *104.38* | *100.00* | *14.18* | *13.58* |
| **තොග මිල (2)** | | | | | | | | |
| වැලිමඩ | 100.00-145.00 | 118.13 | 0.00 | 0.00 | - | - | - | - |
| නුවරඑළිය | 120.00-165.00 | 147.50 | 175.42 | 90.00 | *-27.92* | *-18.93* | - | - |
| ආනයනික | 75.00-120.00 | 95.70 | 94.34 | 74.98 | *1.36* | *1.42* | *20.72* | *21.65* |
| **සිල්ලර මිල (3)** | | | | | | | | |
| වැලිමඩ | | | - | | - | - | - | - |
| නුවරඑළිය | 180.00-280.00 | 221.45 | 230.30 | 168.89 | *-8.84* | *-3.99* | *52.56* | *23.74* |
| ආනයනික | 100.00-180.00 | 138.17 | 137.70 | 95.19 | *0.48* | *0.34* | *42.98* | *31.11* |
| **දළ ආන්තිකය (3-1)** | | | | | | | | |
| වැලිමඩ | | - | - | - | - | - | - | - |
| නුවරඑළිය | | 105.15 | 81.30 | 69.14 | *23.86* | *22.69* | *36.01* | *34.25* |
| ආනයනික | | 33.80 | 137.70 | 4.99 | *-103.90* | *-307.41* | *28.81* | *85.24* |
| **දළ ආන්තිකය (3-2)** | | | | | | | | |
| වැලිමඩ | | - | - | - | - | - | - | - |
| නුවරඑළිය | | 73.95 | 54.88 | - | *19.07* | *25.79* | - | - |
| ආනයනික | | 42.47 | 43.36 | 20.21 | *-0.88* | *-2.08* | *22.26* | *52.42* |

*මූලාශ්‍රය: අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය, හෙ.කො.ගො.ප.පු.ආයතනය*

2019 පෙබරවාරි මාසයට සාපේක්ෂව (මෙ.ටො. 9,802) මෙම මාසයේ දී ආනයනික තොග ප්‍රමාණය ඉහළ මට්ටමක පැවතුණි. පෙබරවාරි මාසයේ දී අර්තාපල් සඳහා සාමාන්‍ය ආනයනික මිල කිලෝවකට රු. 52.00 ක් ලෙස සටහන් විය.

දේශීය අර්තාපල් සැලකීමේ දී කොළඹ තොග වෙළෙඳපොළ තුළ නුවරඑළිය අර්තාපල් සඳහා ප්‍රමාණවත් තොග පැවති අතර, වැලිමඩ අර්තාපල් තොග සුළු වශයෙන් දක්නට ලැබුණි. වැලිමඩ අර්තාපල් සඳහා කොළඹ තොග වෙළෙඳපොළ තුළ සාමාන්‍ය තොග මිල කිලෝවකට රු. 118.00 ක් විය. පෙබරවාරි මාසයේ දී නුවරඑළිය අර්තාපල් සඳහා තොග සහ සිල්ලර මිල ගණන් පිළිවෙලින් 19% කින් හා 4% කින් පහළ ගොස් තිබූ අතර ප්‍රමාණවත් තොග පැවතීම එයට හේතු විය. මේ අතර ආනයනික අර්තාපල් සඳහා තොග මිල 1% කින් වැඩි වී තිබූ අතර, සිල්ලර මිල ගණන් හි සැලකිය යුතු වෙනසක් දක්නට නොලැබුණි. පෙබරවාරි මාසයේ දී නුවරඑළිය සහ ආනයනික අර්තාපල් සඳහා තොග මිල පරාසය කිලෝවකට පිළිවෙලින් රු. 120.00-165.00 සහ රු. 75.00-120.00 අතර අගයක පැවතුණි. පසුගිය වර්ෂයේ සමාන කාලය හා සැසඳීමේ දී, නුවරඑළිය (24%) සහ ආනයනික (31%) අර්තාපල් සඳහා සිල්ලර මිල ගණන් ඉහළ ගොස් තිබුණි. වැලිමඩ අර්තාපල් සඳහා අස්වනු නෙළීමේ කටයුතු ආරම්භවීමත් සමඟ ම මාර්තු මාසයේ සිට දේශීය අර්තාපල් සඳහා මිල ගණන් හි අඩුවීමක් අපේක්ෂා කෙරේ.

**වගුව 2.3.3: අර්තාපල් ආනයනික ප්‍රමාණය, වටිනාකම සහ මිල (2019 සැප්. - 2020 පෙබරවාරි)**

| මාසය | ප්‍රමාණය (මෙ.ටො.) | වටිනාකම (රු.දශ ලක්ෂ) | ආනයනික මිල (මි.ර.ගැ) කි.ග්‍රෑ.රු. | සිල්ලර මිල (කි.ග්‍රෑ.රු.) | දළ ආන්තිකය (කි.ග්‍රෑ.රු.) |
|---|---|---|---|---|---|
| පෙබ.2020 | 16,999 | 887.45 | 52.21 | 138.17 | *85.97* |
| ජන. 2020 | 14,651 | 815.84 | 55.69 | 137.70 | *82.01* |
| දෙසැ.2019 | 14,946 | 927.49 | 62.06 | 159.39 | *97.34* |
| නොවැ. 2019 | 9,697 | 517.68 | 53.39 | 139.86 | *86.47* |
| ඔක්.2019 | 7,550 | 391.41 | 51.84 | 133.94 | *82.10* |
| සැප්.2019 | 10,490 | 505.32 | 48.17 | 134.36 | *86.19* |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව සහ අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය, හෙ.කො.ගො.ප.පු.ආයතනය*

## 2.4 මුංඇට සහ කව්පි

### භෝග තත්ත්වය සහ ප්‍රගතිය

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් පලකරනු ලැබූ නවතම භෝග පුරෝකථන වාර්තාවට අනුව, ජනවාරි මස අවසානයේ 2019/20 මහ කන්නයේ ඉලක්කගත මුංඇට වගාබිම් ප්‍රමාණයෙන් 87% ක් ළඟාකර ගෙන ඇත. වගුඅංක 2.4.1 අනුව, පසුගිය මහ කන්නය, එනම් 2018/19 මහ කන්නය හා සසඳා බැලීමේ දී, මෙම මහ කන්නය තුළ දැනට වගාකොට ඇති බිම් ප්‍රමාණය හෙක්. 4,596කින් ඉහළ ගොස් ඇත. ශ්‍රී ලංකාවේ අපේක්ෂිත මුළු මුංඇට නිෂ්පාදනය මෙ.ටො. 4,521 ක් වන අතර එය පසුගිය මහ කන්නයේ නිෂ්පාදනයට වඩා 4% ක වැඩි වීමකි. නමුත් හම්බන්තොට දිස්ත්‍රික්කයේ වගා හානි වූ ප්‍රමාණය හෙක්. 4,458 ක් වාර්තා විය. ඒ සඳහා අම්බලන්තොට, තිස්සමහාරාමය, බඳගිරිය ආදී ප්‍රදේශවලට අධික වර්ෂාවක් ලැබීම හේතු වී ඇති අතර කුඹුරු බිම්වල කරන තුන්වන කන්නයේ මුංඇට වගා බිම් බොහොමයකට හානි සිදු වී ඇත. හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් හෙක්. 1,329කින් පමණක් අස්වැන්න ලබා ගැනීමට හැකි විය.

2019/20 මහ කන්නයේ ඉලක්කගත කව්පි බිම් ප්‍රමාණයෙන් 39% ළඟාකර ගෙන ඇති අතර එයින් මෙ.ටො. 4,345ක අස්වැන්නක් අපේක්ෂා කරනු ලැබේ. අම්පාර, මොණරාගල සහ අනුරාධපුරය යන දිස්ත්‍රික්ක කව්පි වගා කරනු ලබන ප්‍රධාන දිස්ත්‍රික්ක වන අතර, රටේ මුළු නිෂ්පාදනයෙන් 51%ක අස්වැන්නක් ද ලබාදෙනු ලැබේ. මොණරාගල හා අනුරාධපුරය යන දිස්ත්‍රික්කයන් වඩා හොඳ වගා ප්‍රගතියක් පෙන්නුම් කරනු ලබද්දී අම්පාර දිස්ත්‍රික්කය 12%ක අඩු ප්‍රගතියක් පෙන්නුම් කරනු ලබයි.

## වගුව **2.4.1 :** මුං ඇට සහ කව්පි සඳහා වගා ප්‍රගතිය සහ අපේක්ෂිත නිෂ්පාදනය **(2019/20** මහ කන්නය**)**

| භෝගය | දිස්ත්‍රික්කය | වගා ඉලක්කය (හෙක්.) | | වගා ප්‍රගතිය (හෙක්.) | | වගා ප්‍රගතිය (%) | අපේක්ෂිත අස්වැන්න (මෙ.ටො.) |
|---|---|---|---|---|---|---|---|
| | | **2018/19** මහ | **2019/20** මහ | **2018/19** මහ | **2019/20** මහ | **2019/20** මහ | |
| මුං ඇට | හම්බන්තොට | 2,078 | 4,432 | 1,073 | 5,787 | 131 | 1,980 |
| | මොණරාගල | 1,327 | 658 | 559 | 424 | 64 | 437 |
| | කුරුණෑගල | 779 | 467 | 279 | 326 | 70 | 321 |
| | අනිකුත් දිස්ත්‍රික්ක | 4,146 | 3,842 | 1,630 | 1,600 | 42 | 1,783 |
| | **ශ්‍රීලංකාව** | **8,330** | **9,399** | **3,541** | **8,137** | **87** | **4,521** |
| කව්පි | අම්පාර | 4,284 | 4,400 | 358 | 536 | 12 | 705 |
| | මොණරාගල | 965 | 1,234 | 684 | 862 | 70 | 862 |
| | අනුරාධපුරය | 722 | 618 | 423 | 352 | 57 | 653 |
| | අනිකුත් දිස්ත්‍රික්ක | 3,664 | 3,473 | 2,220 | 2,044 | 59 | 2,125 |
| | ශ්‍රී ලංකාව | **9,635** | **9,725** | **3,685** | **3,794** | **39** | **4,345** |

***මූලාශ්‍රය: භෝග පුරෝකථන වාර්තාව, 2019/20 මහ සහ 2018/19 මහ, සමාජ- ආර්ථික ඒකකය / කෘෂිකර්ම දෙපාර්තමේන්තුව***

## ඉල්ලුම/ සැපයුම සහ මිලෙහි හැසිරීම

පෙබරවාරි මාසය තුළ මුං ඇට තොග මිල කිලෝවකට රු.255.00-290.00 ක පරාසයක් තුළ විහිදී තිබුණු අතර, එහි සාමාන්‍ය මිල කිලෝවකට රු.272.00 ක් ලෙස වාර්තා විය. පසුගිය මාසයට සාපේක්ෂව මුං ඇට සාමාන්‍ය තොග මිල 3%කින් පහළ ගොස් ඇත. මේ හා සමානවම පසුගිය වසරේ සමාන කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී, මුං ඇට සාමාන්‍ය තොග මිල 16%කින් ඉහළ ගොස් ඇත. එමෙන් ම මුං ඇට සිල්ලර මිල කිලෝවකට රු.280.00-340.00 ක පරාසයක් තුළ විහිදී පැවති අතර, එහි සාමාන්‍ය මිල කිලෝවකට රු.300.00 ක් විය. පසුගිය මාසය හා සැසඳීමේ දී, මුං ඇට සිල්ලර මිල කිලෝවකට රු.2.00ක් පමණ පහළ ගොස් ඇත. කෙසේ වුවද, පසුගිය වසරේ සමාන කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී, මෙම මාසය තුළ වාර්තා වූ මිලෙහි වෙනස 16% පමණ ඉහළ යාමකි.

## වගුව : 2.4.2: මුං ඇට සහ කව්පි තොග සහ සිල්ලර මිල **-** 2020 පෙබරවාරි

| වර්ගය | මිල පරාසය | සාමාන්‍ය මිල | | | මිල වෙනස්වීම | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | **2020 පෙබ.** | **2020 පෙබ.** | **2020 ජන.** | **2019 පෙබ.** | **2020 ජන.** | | **2019 පෙබ.** | |
| | (කි.ග්‍රෑ.රු.) | (කි.ග්‍රෑ.රු.) | (කි.ග්‍රෑ.රු.) | (කි.ග්‍රෑ.රු.) | (කි.ග්‍රෑ.රු.) | % | (කි.ග්‍රෑ.රු.) | % |
| තොග මිල | | | | | | | | |
| මුං ඇට | 255.00-290.00 | 272.38 | 281.75 | 234.57 | *-9.38* | *-3.33* | *37.81* | *16.12* |
| කව්පි ( සුදු) | 250.00-270.00 | 257.38 | 246.31 | 220.38 | *11.07* | *4.49* | *37.00* | *16.79* |
| කව්පි (රතු) | 250.00-285.00 | 271.68 | 238.25 | 214.70 | *33.43* | *14.03* | *56.98* | *26.54* |
| සිල්ලර මිල | | | | | | | | |
| මුං ඇට | 280.00-340.00 | 300.45 | 302.03 | 258.21 | *-1.58* | *-0.52* | *42.24* | *16.36* |
| කව්පි (සුදු) | 280.00-340.00 | 303.00 | 297.64 | 275.49 | *5.36* | *1.80* | *27.51* | *9.98* |
| කව්පි (රතු) | 280.00-340.00 | 305.51 | 300.76 | 277.79 | *4.75* | *1.58* | *27.72* | *9.98* |

***මූලාශ්‍රය: අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය, හෙ.කො.ගො.ප.පු.ආයතනය***

පෙබරවාරි මාසය තුළ සුදු සහ රතු කව්පි සඳහා සාමාන්‍ය තොග මිල පිළිවෙළින් කිලෝවකට රු.257.00 ක් සහ රු.272.00 ක් විය. සුදු කව්පි තොග මිල කිලෝවකට රු.250.00-270.00 ක පරාසයක් තුළ ද, රතු කව්පි තොග මිල කිලෝවකට රු.250.00-285.00 ක පරාසයක් තුළ ද සටහන් විය. පසුගිය මාසයට සාපේක්ෂව, සුදු කව්පි තොග මිල 4%කින් ඉහළ ගොස් ඇති අතර, රතු කව්පි මිල 14% කින් පමණ ඉහළ ගොස් ඇත. පසුගිය වසරේ සමාන කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී සුදු කව්පි තොග මිල 17%ක් ඉහළ ගොස් ඇති අතර රතු කව්පි තොග මිල 26% කින් ඉහළ ගොස් ඇත. මේ අතර, සුදු සහ රතු කව්පි සඳහා සාමාන්‍ය සිල්ලර මිල පිළිවෙළින් කිලෝවකට රු.303.00ක් සහ රු.306.00ක් ලෙස සටහන් විය. සුදු කව්පි සහ රතු කව්පි සිල්ලර මිල කිලෝවකට රු. 280.00-340.00ක පරාසයක් තුළ විහිදී තිබුණි. පසුගිය මාසයට සාපේක්ෂව සුදු සහ රතු කව්පි මිල 2% න් ඉහළ ගොස් ඇත. තවද, පසුගිය වසරේ සමාන කාලපරිච්ඡේදය හා සැසඳීමේදී සුදු සහ රතු කව්පි දෙවර්ගයෙහි ම මිල 10% වැඩි වී ඇත.

### වගුව 2.4.3 : මුංඇට ආනයනික ප්‍රමාණය, වටිනාකම සහ ආනයනික මිල (මි.ර.ගැ) (2019 සැප්. - 2020 පෙබරවාරි)

| මාසය | ප්‍රමාණය (මෙ.ටො.) | වටිනාකම (රු.දශ ලක්ෂ) | ආනයනික මිල (මි.ර.ගැ.) (කි.ග්‍රෑ.රු.) | සිල්ලර මිල (කි.ග්‍රෑ.රු.) | දළ ආන්තිකය (කි.ග්‍රෑ.රු.) |
|---|---|---|---|---|---|
| 2020පෙබරවාරි | 2,716 | 518.28 | 190.83 | 300.45 | 109.62 |
| 2020-ජනවාරි | 1,229 | 225.41 | 183.35 | 302.03 | 118.67 |
| 2019-දෙසැම්බර් | 723 | 123.29 | 170.53 | 282.54 | 112.01 |
| 2019-නොවැම්බර් | 752 | 123.76 | 164.56 | 287.93 | 123.37 |
| 2019-ඔක්තෝම්බර් | 1,163 | 194.53 | 167.34 | 282.16 | 114.82 |
| 2019 සැප්තැම්බර් | 1,103 | 182.71 | 165.59 | 281.26 | 115.67 |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව සහ අලෙවි,ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය, හෙ.කො.ගො.ප.පු.ආයතනය*

### වගුව 2.4.4 : ආනයනික කව්පි (සුදු) ප්‍රමාණය, වටිනාකම සහ ආනයනික මිල (මි.ර.ගැ) (2019 සැප්. - 2020 පෙබරවාරි)

| මාසය | ප්‍රමාණය (මෙ.ටො.) | වටිනාකම (රු.දශ ලක්ෂ) | ආනයනික මිල (මි.ර.ගැ.) කි.ග්‍රෑ.රු. | සිල්ලර මිල (කි.ග්‍රෑ.රු.) | දළ ආන්තිකය (කි.ග්‍රෑ.රු.) |
|---|---|---|---|---|---|
| පෙබ.2020 | 495 | 76.79 | 155.17 | 303.00 | 147.83 |
| ජන. 2020 | 413 | 58.56 | 141.81 | 297.64 | 155.82 |
| දෙසැ.2019 | 510 | 69.28 | 135.91 | 285.97 | 150.05 |
| නොවැ. 2019 | 1,067 | 144.65 | 135.57 | 292.20 | 156.63 |
| ඔක්.2019 | 1,371 | 178.03 | 129.81 | 289.84 | 160.02 |
| සැප්.2019 | 797 | 100.74 | 126.35 | 281.73 | 155.39 |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව සහ අලෙවි,ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය, හෙ.කො.ගො.ප.පු.ආයතනය*

මෙම මස තුළ මුංඇට මෙ.ටො. 2,716 ක ප්‍රමාණයක් ආනයනය කර ඇති අතර, එය පසුගිය මාසයේ ආනයනය කරන ලද ප්‍රමාණය හා සැසඳීමේදී 121% න් ඉහළ ගොස් ඇත. මුංඇට කිලෝවක සාමාන්‍ය ආනයනික මිල රු.190.83ක් ලෙස සටහන් වූ අතර, එය පසුගිය මාසයේ වාර්තා වූ මිලට සාපේක්ෂව 4% න් ඉහළ ගොස් ඇත. මුංඇට ආනයනික තොගය සඳහා වැය වූ මුළු මුදල රු. දශ ලක්ෂ 518.28 ක් ලෙස වාර්තා වූ අතර, එය පසුගිය මාසයේ මුංඇට ආනයනය සඳහා වැය වූ මුදලට සාපේක්ෂව 130% ක වැඩි වීමකි. මෙම මාසය තුළ ආනයනය කරන ලද මුංඇට තොගයෙන් 82% ක් මියන්මාර් වලින් ද, තායිලන්තය, උස්බකිස්තාන් සහ දකුණු අප්‍රිකාවෙන් 4% බැගින් ද, ආජන්ටිනාව සහ කෙන්යාවෙන් 3% බැගින් ද ආනයනය කර ඇත.

කව්පි දෙවර්ගය අතරින් පෙබරවාරි මාසය තුළ සුදු කව්පි මෙ.ටො. 495 ක ප්‍රමාණයක් ආනයනය කර ඇත. එය, පසුගිය මාසයේ ආනයනය කරන ලද ප්‍රමාණයට වඩා 20% කින් ඉහළ යාමකි. සුදු කව්පි කිලෝවක සාමාන්‍ය ආනයනික මිල රු.155.00 ක් ලෙස වාර්තා විය. කව්පි ආනයනික පිරිවැය පසුගිය මාසයට සාපේක්ෂව 31% කින් පමණ ඉහළ ගොස් ඇත. වගු අංක 2.4.4 අනුව, කව්පි ආනයනය සඳහා මේ මස වැය වූ මුදල දළ වශයෙන් රු. දශ ලක්ෂ 76.79 ක් පමණ වේ. මුළු කව්පි ආනයනික තොගය මියන්මාරයෙන් (62%), ඉන්දියාවෙන් (24%) සහ මැඩගස්කර් වලින් (14%) ආනයනය කර ඇත.

### 2.4.5: මුංඇට සහ කව්පි සඳහා මාසික සාමාන්‍ය ආනයනික මිල, තොග සහ සිල්ලර මිල

| භෝගය | මාසය | ආනයනික මිල (මි.ර.ගැ.) කි.ග්‍රෑ.රු. | තොග මිල කි.ග්‍රෑ.රු. | සිල්ලර මිල කි.ග්‍රෑ.රු. | ආන්තිකය ( කි.ග්‍රෑ.රු.) | |
|---|---|---|---|---|---|---|
| | | | | | තොග මිල - ආනයනික මිල (මි.ර.ගැ.) | සිල්ලර මිල - තොග මිල |
| මුංඇට | 2020 පෙබ. | 190.83 | 272.38 | 300.45 | 81.55 | 28.07 |
| | 2019 ජන | 183.35 | 281.75 | 302.03 | 98.40 | 20.28 |
| | 2019පෙබ. | 165.29 | 234.57 | 258.21 | 69.28 | 23.64 |
| සුදු කව්පි | 2020 පෙබ. | 155.17 | 257.38 | 303.00 | 102.21 | 45.63 |
| | 2019 ජන | 141.81 | 246.31 | 297.64 | 104.49 | 51.33 |
| | 2019පෙබ. | 113.93 | 220.38 | 275.49 | 106.45 | 55.12 |
| රතු කව්පි | 2020 පෙබ. | - | 271.68 | 305.51 | - | 33.83 |
| | 2019 ජන | - | 238.25 | 300.76 | - | 62.51 |
| | 2019පෙබ. | - | 214.70 | 277.79 | - | 63.09 |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව සහ අලෙවි,ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය, හෙ.කො.ගො.ප.පු.ආයතනය*

## 2.5 රතු පරිප්පු

### ඉල්ලුම/ සැපයුම හා මිලෙහි හැසිරීම

රතු පරිප්පු තොග මිල කිලෝවකට රු.123.00-130.00 ක පරාසයක් තුළ විහිදී තිබුණු අතර, එහි සාමාන්‍ය තොග මිල කිලෝවකට රු.126.00ක් ලෙස වාර්තා විය. තවද, රතු පරිප්පු සිල්ලර මිල කිලෝවකට රු.135.00-160.00ක පරාසයක් තුළ විහිදී තිබුණු අතර, එහි සාමාන්‍ය මිල කිලෝවකට රු.143.00ක් ලෙස වාර්තා විය. එමෙන් ම, මෙම මාසය තුළ රතු පරිප්පු සඳහා වන තොග හා සිල්ලර මිල ගණන්හි වෙනස රු.17.00කි. ජනවාරි මාසය හා සැසඳීමේ දී තොග මිල 2%කින් පහළ යැමක් සහ සිල්ලර මිල 2%කින් ඉහළ යාමක් වාර්තා විය. පසුගිය වසරේ සමාන කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී, තොග සහ සිල්ලර මිල යන දෙකම 9%ක් වැඩි වී ඇත. (වගු අංක.2.5.1).

වගුව **2.5.1 :** රතු පරිප්පු තොග සහ සිල්ලර මිල - **2020** පෙබරවාරි

| වර්ගය | මිල පරාසය | සාමාන්‍ය මිල | | | මිල වෙනස්වීම | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | **2020 පෙබ.** | **2020 පෙබ.** | **2020 ජන.** | **2019 පෙබ.** | **2020 ජන.** | | **2019 පෙබ.** | |
| | (කි.ග්‍රෑ.රු.) | (කි.ග්‍රෑ.රු.) | (කි.ග්‍රෑ.රු.) | (කි.ග්‍රෑ.රු.) | (කි.ග්‍රෑ.රු.) | % | (කි.ග්‍රෑ.රු.) | % |
| තොග මිල | 123.00-130.00 | 126.08 | 128.22 | 115.54 | *-2.14* | *-1.67* | *10.54* | *9.12* |
| සිල්ලර මිල | 135.00-160.00 | 143.07 | 140.11 | 131.22 | *2.97* | *2.12* | *11.85* | *9.03* |

*මූලාශ්‍රය: අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය, හෙ.කො.ගො.ප.පු.ආයතනය*

### වගුව 2.5.2 : රතු පරිප්පු සඳහා මාසික සාමාන්‍ය ආනයනික, තොග සහ සිල්ලර මිල (2019 සැප්තැම්බර් - 2020 පෙබරවාරි)

| මාසය | ප්‍රමාණය (මෙ.ටො.) | ආනයනික මිල (මි.ර.ගැ.) කි.ග්‍රෑ.රු. | තොග මිල කි.ග්‍රෑ.රු. | සිල්ලර මිල කි.ග්‍රෑ.රු. | ආන්තිකය (කි.ග්‍රෑ.රු.) | |
|---|---|---|---|---|---|---|
| | | | | | තොග මිල - ආනයනික මිල | සිල්ලර මිල - තොග මිල |
| පෙබරවාරි | 11,183 | 84.83 | 126.08 | 143.07 | 41.24 | 17.00 |
| ජනවාරි | 13,016 | 80.53 | 128.22 | 140.11 | 47.69 | 11.89 |
| දෙසැම්බර් | 19,642 | 76.23 | 115.28 | 133.37 | 39.04 | 18.10 |
| නොවැම්බර් | 22,041 | 74.42 | 108.08 | 128.54 | 33.66 | 20.47 |
| ඔක්තෝම්බර් | 18,707 | 76.60 | 107.15 | 128.15 | 30.55 | 21.00 |
| සැප්තැම්බර් | 9,372 | 80.11 | 106.71 | 127.23 | 26.61 | 20.52 |

මූලාශ්‍රය :*ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව සහ අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය, හෙ.කො.ගො.ප.පු.ආයතනය*

මෙම මස තුළ රතු පරිප්පු මෙ.ටො. 11,183 ක් ආනයනය කර ඇති අතර, එම තොගයේ කිලෝවක සාමාන්‍ය ආනයනික මිල රු.84.83 ක් ලෙස සටහන් විය. පසුගිය මාසයේ සාමාන්‍ය ආනයනික මිලට සාපේක්ෂව මෙම මස සාමාන්‍ය ආනයනික මිල 5%කින් පමණ ඉහළ ගොස් ඇත. පසුගිය මාසයේ ආනයනික මුළු පරිප්පු තොගයට සාපේක්ෂව මෙම මස ආනයනික ප්‍රමාණය 14%ක් පහළ ගොස් ඇත. මුළු රතු පරිප්පු තොගය ම පියළි නොකළ රතු පරිප්පු වූ අතර, පියළි නොකරන ලද රතු පරිප්පු තොගයෙන් 68% ක් ඕස්ට්‍රේලියාවෙන් ද, 32%ක් කැනඩාවෙන් ද ආනයනය කොට ඇත. පියළි නොකරන ලද රතු පරිප්පු තොගයේ මුළු වටිනාකම රු. දශ ලක්ෂ 949 ක් විය.

## 3.එළවළු

### භෝග තත්ත්වය

උඩරට සහ පහතරට එළවළු දෙවර්ගය ම සඳහා සමස්ථ ඉලක්කය හෙක්.47,384ක් වූ අතර, 2019 ජනවාරි මස අග වනවිට 66%ක වගා ප්‍රගතියක් වාර්තා කර ඇත. උඩරට එළවළු වගා ඉලක්කය හෙක්.14,890ක් ද, 64%ක ප්‍රගතියක් ද වාර්තා විය. උඩරට එළවළු වර්ග අතරින් බෝංචි (හෙක්.2,972), මාළු මිරිස් (හෙක්.1,502), ගෝවා (හෙක්.1,342) සහ කැරට් (හෙක්. 1,233) යන එළවළු වර්ග වැඩි වශයෙන් වගා කර තිබුණු අතර, ගෝවා (මෙ.ටො.36,363), බෝංචි (මෙ.ටො.30,848) සහ කැරට් (මෙ.ටො.25,278) සඳහා ඉහළ නිෂ්පාදනයක් අපේක්ෂිතය. පහතරට එළවළු වගා ඉලක්කය හෙක්.32,494ක් ද, 2019 ජනවාරි මස අවසන් වන විට 68%ක ප්‍රගතියක් ද අත්පත් කරගෙන තිබුණි. එමෙන් ම පහතරට එළවළු වර්ග අතරින් වම්බටු (හෙක්.4,041), මෑ කරල් (හෙක්.3,709) බණ්ඩක්කා (හෙක්.2,964) සහ වට්ටක්කා (හෙක්.2,872) යන එළවළු වර්ග වැඩි වශයෙන් වගා කර තිබූ අතර, වම්බටු (මෙ.ටො.48,633), වට්ටක්කා (මෙ.ටො.40,275), තක්කාලි (මෙ.ටො.35,513) සහ මෑ කරල් (මෙ.ටො.34,323) සඳහා ඉහළ සැපයුමක් අපේක්ෂිතය (***Crop Forcast Maha 2019/20 Vol.03, Socio Economics & Planning Center/ DOA***).

### ඉල්ලුම / සැපයුම සහ මිල හැසිරීම

බොහොමයක් එළවළු නිෂ්පාදන ප්‍රදේශවල 2019/20 මහ කන්නයේ අස්වනු නෙළීම් කටයුතු ආරම්භ වී පැවතුණි. එම නිසා පසුගිය මාසයට සාපේක්ෂව බොහොමයක් වෙළෙඳපොළවලට එළවළු සැපයුම ද ඉහළ ගොස් තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස උඩරට එළවළුවල මිල ගණන් 7%-33% පරාසය තුළ සැළකිය යුතු ලෙස පහළ යන ලදී. උපරිම මිල පහළ යාම (33%) බීට් රූට් සඳහා ද, අවම මිල පහළ යාම ගෝවා (7%) සඳහා ද, විය. තවද, ගෝවා හැර අනෙකුත් උඩරට එළවළු වර්ග සඳහා තොග මිල පහළ යාම 24%-33% පරාසය තුළ පැවතුණි. උපරිම තොග මිල කිලෝවක රු.420.00ක් ලෙස කැරට් සඳහා ද, අවම තොග මිල රු.50.00ක් නොකෝල් සහ රාබු සඳහා ද විය. පහතරට එළවළු මිල සැළකූ විට වට්ටක්කා හැර අනෙකුත් සියළුම එළවළු වර්ගවල තොග මිල 2%-52% පරාසය තුළ පහළ ගොස් තිබුණු අතර, එහි උපරිමය පිපිඤ්ඤා සඳහා ද, අවමය අළු කෙසෙල් සඳහා ද විය. තවද, බොහොමයක් පහතරට එළවළු වර්ග වල තොග මිල ගණන් 10% වැඩියෙන් පහළ ගොස් තිබුණි. එසේ වුවද, වට්ටක්කා නිෂ්පාදනය තවමත් වෙළෙඳපොළට පැමිණ නොමැති බැවින් තොග මිල ගණන් 103%කින් ඉහළ ගිය අතර, කිලෝවක මිල රු.100.00-180.00 අතර පරාසය තුළ පැවතුණි. පහතරට එළවළු වර්ග අතුරින් උපරිම මිල කිලෝවකට රු.390.00 ලෙස තක්කාලි සඳහා ද, අවම මිල කිලෝවකට රු.20.00ක් ලෙස පිපිඤ්ඤා සඳහා ද වාර්තා විය.

පසුගිය වසරේ සමාන කාලපරිච්ඡේදය හා සමඟ සසඳන විට, උඩරට එළවළු සඳහා 165%-440% පරාසය තුළ මිල ඉහළ යාමක් වාර්තා වූ අතර එහි උපරිමය ගෝවා සඳහා ද අවමය නෝකෝල් සඳහා ද විය. පහතරට එළවළු වර්ගවල මිල ගණන් 10% (පිපිඤ්ඤා) සහ 839% (වට්ටක්කා) පරාසය තුළ ඉහළ ගොස් තිබුණි.

එළවළු සඳහා තොග වෙළෙඳපොළ මිල හැසිරීමට සමාන මිල හැසිරීමක් සිල්ලර වෙළෙඳපොළ තුළ ද දක්නට ලැබුණි. උඩරට එළවළු වර්ග සඳහා මිල ගණන් 5%-30% පරාසය තුළ පහළ ගිය අතර, එහි උපරිමය බීට් රූට් සඳහා ද, අවමය ගෝවා සඳහා ද විය. උඩරට එළවළු අතරින් ඉහළම සිල්ලර මිල කිලෝවකට රු.580.00ක් ලෙස කැරට් සඳහා ද, අවම සිල්ලර මිල රාබු සඳහා ද විය. බොහොමයක් පහතරට එළවළු වර්ග වල සිල්ලර මිල ගණන් ද 6%-28% පරාසය තුළ පහත වැටුණු අතර, එහි උපරිමය වම්බටු සඳහා ද අවමය තක්කාලි සඳහා ද විය. එසේ වුව ද වට්ටක්කා සිල්ලර මිල ගණන් 71%කින් පමණ ඉහළ ගොස් තිබුණි. පහතරට එළවළු වර්ග අතුරින් තක්කාලි සඳහා ඉහළම මිල (කිලෝවකට මිල රු.600.00) ද, පිපිඤ්ඤා සඳහා අවම මිල (කිලෝවකට රු.50.00) ද වාර්තා විය.

## වගුව 3.1 : එළවළු තොග මිල - 2020 පෙබරවාරි

| වර්ගය | මිල පරාසය | සාමාන්‍ය මිල | | | මිල වෙනස්වීම | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2020 පෙබ. | 2020 පෙබ. | 2020 ජන. | 2019 පෙබ. | 2020 ජන. | | 2019 පෙබ. | |
| | (කි.ග්‍රෑ.රු.) | (කි.ග්‍රෑ.රු.) | (කි.ග්‍රෑ.රු.) | (කි.ග්‍රෑ.රු.) | (කි.ග්‍රෑ.රු.) | % | (කි.ග්‍රෑ.රු.) | % |
| බෝංචි | 130.00-300.00 | 199.20 | 268.00 | 65.83 | *-68.80* | *-25.67* | *133.37* | *202.59* |
| කැරට් | 120.00-420.00 | 251.00 | 365.50 | 70.83 | *-114.50* | *-31.33* | *180.17* | *254.35* |
| ලීක්ස් | 100.00-250.00 | 190.25 | 278.00 | 43.44 | *-87.75* | *-31.56* | *146.81* | *337.99* |
| බීට්රූට් | 80.00-180.00 | 130.09 | 195.09 | 40.66 | *-65.01* | *-33.32* | *89.42* | *219.93* |
| නෝකෝල් | 50.00-160.00 | 107.75 | 144.25 | 40.63 | *-36.50* | *-25.30* | *67.13* | *165.23* |
| රාබු | 50.00-80.00 | 60.41 | 80.00 | 17.98 | *-19.59* | *-24.49* | *42.42* | *235.94* |
| ගෝවා | 60.00-140.00 | 103.13 | 111.36 | 20.47 | *-8.24* | *-7.40* | *82.66* | *403.80* |
| තක්කාලි | 120.00-390.00 | 257.25 | 288.25 | 39.27 | *-31.00* | *-10.75* | *217.98* | *555.07* |
| බණ්ඩක්කා | 40.00-170.00 | 109.75 | 177.00 | 44.48 | *-67.25* | *-37.99* | *65.27* | *146.74* |
| වම්බටු | 70.00-130.00 | 97.60 | 153.82 | 44.75 | *-56.21* | *-36.54* | *52.85* | *118.11* |
| මාළු මිරිස් | 120.00-300.00 | 213.75 | 291.75 | 110.42 | *-78.00* | *-26.74* | *103.33* | *93.58* |
| වට්ටක්කා | 100.00-180.00 | 149.00 | 73.38 | 15.88 | *75.63* | *103.07* | *133.13* | *838.58* |
| පිපිඤ්ඤා | 20.00-70.00 | 35.31 | 73.05 | 32.05 | *-37.74* | *-51.66* | *3.26* | *10.16* |
| කරවිල | 90.00-190.00 | 139.49 | 173.79 | 105.38 | *-34.30* | *-19.74* | *34.11* | *32.37* |
